# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 1974/22 - 2016 ජූලි මස 08 වැනි සිකුරාදා - 2016.07.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය.* :නුඑ/3/1/1/අත්පත්/111/49.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4/3/12/2012/සීර්බී/309.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළයේ සුළු කොට්ඨාසයේ, තලවාකැලේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි. නු. 2890 හා 2014.04.29 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 ලෙස පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0490 ක් පමණ වන ඉඩම් කොටසේ විස්තර:

1. **කැබලි අංක 1**
ඉඩමේ නම: තලවාකැලේ වත්ත; විස්තරය: ගෙවත්ත, තාවකාලික වගාවක් සහ ස්ථිර ගොඩනැගිලි 2ක් ඇත; හිමිකම් කියන අය : මස්කෙලිය වැවිලි සමාගම; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0490

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජූලි මස 29 වැනි දින පෙ.ව. 10.30ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 ජූලි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2016 ජූලි මස 04 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 898/1

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය.* :නුඑ/3/1/1/අත්පත්/111/47.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4/3/12/2012/සීර්බී/121.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළයේ සුළු කොට්ඨාසයේ, හොලිරූඩ් ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද

අංක 330605 කලාප 01 න් 01 වැනි කලාපයෙන් පත්‍ර අංක 5 හා 2016.02.01 දිනැති කැඩැස්තර සිතියමේ මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.6914 ක් පමණ වන ඉඩම් කොටස්වලට මායිම්:

1. **කැබලි අංක 228**

ඉඩමේ නම: හොලිරූඩ් වත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 3, තාවකාලික ගොඩනැගිල්ලක්, තේ වගාවක් සහ ලඳු කැලයක් පිහිටා ඇත; හිමිකම් කියන අය : රජය; භුක්ති විඳින අය: සීමාසහිත තලවාකැලේ වැවිලි සමාගම ; ප්‍රමාණය : හෙක්ටයාර් 1.6914

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජූලි මස 28 වැනි දින පෙ.ව. 10.30ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 ජූලි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2016 ජූලි මස 04 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 898/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.